# වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 02

මගේ අංකය : ටීටීඅයිපී/01/2007(1)
වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
කොළඹ 01.

2007.08.27

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත,

## අනුග්‍රාහක පදනම මත වාහන ආනයනය කිරීම

මෙම වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 02 මගින් 2007.03.30 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01 හා 2007.04.16 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01 (i) සංශෝධනය කරන අතර, මෙහි විධිවිධාන 2007 සැප්තැම්බර් 03 දින සිට ක්‍රියාත්මක වේ.

## 01. යෝග්‍යතාව

පහත සඳහන් සුදුසුකම් සපුරාලන නිලධාරීන් මෙම චක්‍රලේඛයේ 03 ඡේදය යටතේ වන කොන්දේසි හා නියමයන්ට අනුව බදු සහන මත වාහන ආනයන බලපත්‍රයක් ලබාගැනීම සඳහා හිමිකම් ලබයි.

(i ) 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි සඳහන් වන රජයේ සේවයේ $ජ්‍යෙෂ්ඨ මට්ටම ට අයත් සේවාවන්වල පහතින් දක්වා ඇති වැටුප් කේතාංක යටතට ගැනෙන ස්ථිර තනතුරක් දරන අවම වශයෙන් අවුරුදු 05 ක අඛණ්ඩ හා සක්‍රීය සේවයක් සහිත නිලධාරීන්,

| | | |
|---|---|---|
| එස් එල් 1-2006 | එස් එල් 5-2006 | එස් එෆ් 1-2006 |
| එස් එල් 2-2006 | එස් එල් 6-2006 | එස් එෆ් 2-2006 |
| එස් එල් 3-2006 | එස් එල් 7-2006 | එස් එෆ් 3-2006 |
| එස් එල් 4-2006 | එස් එල් 8-2006 | එස් එෆ් 4-2006 |

(ii) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සේවයේ නියුක්ත, උපලේඛන අංක I හි සඳහන් ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05 ක අඛණ්ඩ හා සක්‍රීය සේවයක් සහිත නිලධාරීන්.

(iii) ත්‍රිවිධ හමුදාවල සේවයේ නියුක්ත උපලේඛන අංක II හි සඳහන් ස්ථිර තනතුරක හෝ ඊට ඉහළ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 5 ක අඛණ්ඩ හා සක්‍රීය සේවයක් සහිත නිලධාරීන්.

(iv) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවයේ නියුක්ත උපලේඛන අංක III හි සඳහන් ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05 ක අඛණ්ඩ හා සක්‍රීය සේවා කාලයක් සහිත නිලධාරීන්.

(v) මෙම චක්‍රලේඛය සඳහා සක්‍රීය සේවය යන්නෙන් අදහස් කරනුයේ සුදුසුකම් ලබන තනතුරක් සඳහා නිලධාරියාගේ සේවා කාලය ගණනයේදි වැඩ තහනමකට ලක්වීම මත හෝ වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම මත හෝ අදාළ තනතුරට පත්වීම පෙරදාතම් කිරීම මත වන්නා වූ කාලය නොසලකා ගණනය කරනු ලබන සේවා කාලය වේ.

## 02. හිමිකම් නොලබන විශේෂ අවස්ථා

පහත දැක්වෙන විශේෂ අවස්ථා යටතට ගැනෙන නිලධාරීන් මෙම චක්‍රලේඛය පරිදි වාහන ආනයන බලපත්‍රයක් ලබාගැනීම සඳහා හිමිකම් නොලබයි.

(i) මෙම චක්‍රලේඛයේ 01 ඡේදයේ සඳහන් සුදුසුකම් ලබන තනතුරක් හෝ වැටුප් ක්‍රමයක් සඳහා පෞද්ගලික වනසේ හෝ අධි සේවක පදනම මත පත්කර ඇති හෝ වැටුපක් ලබාදී ඇති නිලධාරීන්.

(ii) අයදුම්පත් ඉදිරිපත් කරන දිනට පෙර වසර 5 ක කාලයක් තුළදී 1999.02.22 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 866 හෝ 1999.06.23 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 866 (1) හෝ 2000.04.07 දිනැති විදේශ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 165 යටතේ හෝ වෙනයම් අනුග්‍රහ යෝජනා ක්‍රමයක් යටතේ වාහනයක් ආනයනය කර ඇති නිලධාරීන්.

(iii) මෙම චක්‍රලේඛයේ 01 ඡේදයේ සඳහන් සුදුසුකම් ලබන නිලධාරී කාණ්ඩයන්ගෙන් රජය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ද්විතීයනය පදනම මත හෝ වැටුප් රහිත නිවාඩු මත හෝ දැනට නිදහස් කර ඇති නිලධාරීන්.

(iv) තම සේවා කාලය අවසන් කර රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් පසුව කොන්ත්‍රාත් පදනම මත මෙම චක්‍රලේඛයේ 01 ඡේදයේ සඳහන් සුදුසුකම් ලබන තනතුරක් සඳහා නැවත පත් කර ඇති නිලධාරීන්.

## 03. කොන්දේසි සහ නියමයන්

(i) මෙම යෝජනා ක්‍රමය යටතේ අනුග්‍රහය ලබන නිලධාරියාගේ සේවා කාලය ගණන් ගනු ලබන්නේ සුදුසුකම් ලබන තනතුරට පත්වීම ලද දින සිට හෝ අදාළ තනතුරට උසස් වීම් ලද දින සිටය.

(ii) මෙම යෝජනා ක්‍රමය යටතේ වාහනයක් ආනයනය කිරීම වෙනුවෙන් නීතිමය බැඳීමක් ඇතිකර ගැනීමට පෙර (උදා: ණයවර ලිපි විවෘත කිරීම) භාණ්ඩාගාරයේ ලේකම් හෝ වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ.

(iii) මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන නිලධාරියකු දරන තනතුරු ගණන නොසලකා එක් වාහනයක් ආනයනය කිරීම සඳහා පමණක් හිමිකම් ලබනු ඇත.

(iv) මෙම යෝජනා ක්‍රමය යටතේ අළුත්ම (පාවිච්චි නොකළ, Brand New) වාහනයක් ආනයනය කිරීම සඳහා පමණක් අවසර ඇත. තවද, මෙම චක්‍රලේඛයෙහි අවශ්‍යතා සඳහා වාහනය යන්නට කාර්, ජීප්, සිංගල් කැබ් සහ ඩබල් කැබ් පමණක් අයත්වේ.

(v) මෙම යෝජනා ක්‍රමය යටතේ වාහනයක් ආනයනය කරනු ලබන නිලධාරීන් විසින් තම ආදායම් තත්ත්වය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත අනාවරණය කළ යුතුය. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අදාළ නිලධාරියාගේ ආදායම් බදු තත්ත්වය පිළිබඳ සහතිකයක් නිකුත් කරනු ඇත.

(vi) මෙම යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහනයක්, ආනයනය කළ දින සිට වසර 5 ක් අවසන් වන තෙක් විකිණීම, පැවරීම, බදුදීම, කුලියට දීම හෝ වෙන කවර ආකාරයකට හෝ බැහැර කිරීමක් නොකළ යුතුය. එසේ වුවත්, වාහනය මිලට ගැනීම සඳහා ණය ලබා ගැනීම වෙනුවෙන් එම වාහනය රාජ්‍ය නොවන වාණිජ බැංකුවකට හෝ පිළිගත් මූල්‍ය ආයතනයකට උකස් කිරීම පමණක් කළ හැකිය.

(vii) මෙම යෝජනා ක්‍රමය යටතේ ආනයනය කළ වාහනයක් භාණ්ඩාගාරයේ ලේකම්ගේ පූර්ව අවසරයකින් තොරව පැවරීම් කළ නොහැකි බවට සටහනක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් වසර 05 කට බලාත්මක වන පරිදි වාහන ලියාපදිංචි සහතිකයෙහි යොදනු ඇත. ඊට අමතරව වාහනයට අදාල අංක තහඩුවල විශේෂ හඳුනාගැනීමේ සළකුණක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් යොදනු ඇත.

(viii) මෙම යෝජනා ක්‍රමය යටතේ වාහනයක් ආනයනය කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගන්නා ලද බලපත්‍ර ලාභියකු, එම බලපත්‍රය වලංගු කාලය ඉකුත් වීමට ප්‍රථම හෝ වාහන ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීම හෝ වාහනය නැව්ගත කර තිබියදී හෝ වාහනය ආනයනය කළ දින සිට වසර පහක් ඉකුත් වීමට ප්‍රථම හෝ මියගිය හොත් එම බලපත්‍රලාභියාගේ නිත්‍යානුකූල හිමිකම ඔහුගේ/ඇයගේ කලත්‍රයාට ලබාගත හැකි වන්නේය.

(ix) මෙම යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරන ලද වාහනයක් වසර පහක කාලයක් ගතවීමට ප්‍රථම භාණ්ඩාගාරයේ ලේකම්ගේ අවසරයෙන් අපහරණය කරන්නේ නම් එදිනට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් ක්ෂය පදනම මත ගණනය කරනු ලබන බදු මුදල සහ බලපත්‍රලාභියා (ආනයනකරු) එම වාහනය ආනයනය කිරීමේදී ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට ගෙවනු ලැබූ බදු මුදල අතර වෙනස ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය.

(x) මෙම යෝජනා ක්‍රමය යටතේ වාහනයක් ආනයනය කිරීම සඳහා ණය ලබාගැනීම වෙනුවෙන් රාජ්‍ය නොවන වාණිජ බැංකුවකට හෝ පිළිගත් මූල්‍ය ආයතනයකට උකස් කිරීම හැර ආනයනය කරනු ලබන වාහනයක් භාණ්ඩාගාරයේ ලේකම්ගේ පූර්ව අවසරයකින් තොරව ආනයනය කළ දින සිට අවුරුදු පහක කාල පරිච්ඡේදය අවසන් වීමට ප්‍රථමයෙන් විකිණීම, පැවරීම, කුලියට දීම හෝ වෙනයම් අන්දමකින් බැහැර කිරීමක් කලහොත් හෝ මෙම චක්‍රලේඛයේ සඳහන් කවර හෝ කොන්දේසි හෝ නියමයන් උල්ලංඝණය කළහොත්, රේගු ආඥා පනත යටතේ නිත්‍යානුකූලව කටයුතු කරනු ඇත.

(xi) මෙම යෝජනා ක්‍රමය යටතේ යම් බලපත්‍රලාභියකු එම බලපත්‍රයේ සඳහන් සිලින්ඩර ධාරිතාව හා/හෝ මිල රක්ෂණ ගැල් කුලී (මි.ර.ගැ.) වටිනාකම ඉක්මවා වාහනයක් ආනයනය කළහොත් මෙම බදු සහනය ලැබීමට හිමිකම් නොලබයි. එහෙත් බලපත්‍රලාභියකු ණයවර ලිපිය විවෘත කරන අවස්ථාවේදී බලපත්‍රයේ සඳහන් උපරිම මි.ර.ගැ. වටිනාකම නොඉක්මවා ඇති නමුත් වාහනය ශ්‍රී ලංකාවට පැමිණෙන අවස්ථාවේ විනිමය අනුපාතයන්ගේ වෙනස්වීම් මත උපරිම මි.ර.ගැ. වටිනාකම ඉක්මවා ඇත්නම් එම අවස්ථාවේදී 10% ක උපරිම මිල වෙනස්වීමක් පිළිබඳ සලකා බලනු ලබයි. මෙලෙස ඉක්මවා ඇති මි.ර.ගැ. වටිනාකම සඳහා පමණක් සම්පූර්ණ බදු මුදල් ගෙවීමට බලපත්‍රලාභියා යටත් වේ. කෙසේ වුවත්, උපරිම මි.ර.ගැ. වටිනාකම මෙහි සඳහන් සහන සීමාව (10%) ද ඉක්මවා ඇති විටෙක ආනයනය කරන වාහනය සඳහා මෙම චක්‍රලේඛයේ සඳහන් බදු සහනවලට හිමිකම් නොලබනු ඇත. විනිමය අනුපාතයන්ගේ වෙනස්වීම්වලට මි.ර.ගැ. වටිනාකම ලක්විය හැකි බැවින් මේ පිළිබඳ සැලකිලිමත්වීම ද බලපත්‍රලාභියාගේ වගකීමක් වනු ඇත.

(xii) මෙම යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහනයක්, ආනයනය කළ දින සිට වසර 05 ක කාලයක් ඉකුත් වීමෙන් පසු මෙම චක්‍රලේඛයේ සඳහන් බැඳීම්වලින් නිදහස් වනු ඇත.

## 04. බදු සහන

(i) මෙම යෝජනා ක්‍රමය යටතේ ආනයනය කළ හැකි වාහනයේ වර්ගය, උපරිම සිලින්ඩර ධාරිතාව සහ උපරිම මි.ර.ගැ. වටිනාකම ඇමුණුම 1 මගින් දක්වා ඇත.

(ii) මෙම යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහන සඳහා ගෙවිය යුතු

තීරුබදු සහ එකතුකළ අගය මත බදු යන බදුවල එකතුව, මි.ර.ගැ. වටිනාකමේ ප්‍රතිශතයක් වශයෙන් ඇමුණුම 1 හි (6) වන තීරුවෙහි දැක්වේ. මීට අමතරව මෙම චක්‍රලේඛයට විශේෂිතව, නිෂ්පාදන (විශේෂ විධි විධාන) බදු පනතේ 3 වගන්තිය යටතේ පනවනු ලබන නියෝගයේ සඳහන් බදු ප්‍රතිශතයක්, සෙස් බදු, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන ගාස්තු, ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන ගාස්තු, සමාජ වගකීම් ගාස්තු හා වරින්වර පැනවිය හැකි වෙනත් බදු හෝ ගාස්තු ආනයනකරු විසින් ගෙවිය යුතුය. තවද, 2007 .05.14 දිනැති අංක 1497/1 දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් වන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු අනුපාතයන් තවදුරටත් සංශෝධනය කරනු ඇත.

(iii) ඇමුණුම 1 හි සඳහන් විකල්පයක් (අදාල පරිදි) සුදුසුකම් ලබන නිලධාරීන්ට තෝරා ගත හැකිය.

## 05. ක්‍රියා පරිපාටිය

(i) මෙම චක්‍රලේඛය යටතේ වාහනයක් ආනයනය කිරීමට බලාපොරොත්තු වන සුදුසුකම් ලබන නිලධාරියකු විසින් ඇමුණුම II යටතේ දැක්වෙන අයදුම් පත්‍රයක් මඟින් ඉල්ලීමක් කළ යුතුවේ. එවැනි ඉල්ලුම් පත්‍රයක් අමාත්‍යාංශ ලේකම්වරුන්/ පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් විසින් පෞද්ගලිකවම නිර්දේශ කළ යුතු වේ.

(ii) අයදුම්පත්‍රයක ඇතුලත් තොරතුරු හා දත්ත පිළිබඳ වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියකු සෑහීමකට පත්වේ නම් එම නිලධාරියා විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල්ට හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ටද, පිටපත් සහිතව බදු සහන අනුමත කිරීමේ බලපත්‍රයක් නිකුත් කරනු ඇත.

(iii) රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ බදු සහන ලබාදෙනුයේ වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ බලය පවරනු ලබන නිලධාරියකුගේ අනුමත ලිපියේ සඳහන් නියමයන් හා කොන්දේසි සම්පූර්ණ කර ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසුවය.

## 06. වෙනත් කරුණු

(i) මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පිළිබඳ අවිනිශ්චිතතාවයන් ඇතිවුවහොත් ඒ පිළිබඳ පරීක්ෂා කර භාණ්ඩාගාරයේ ලේකම් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (සභාපති), කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල් සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබූ නියෝජිතයකුගෙන් සමන්විත කමිටුවක් වෙත යොමු කරනු ඇත. ඒ පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය භාණ්ඩාගාරයේ ලේකම් සතුවේ.

(ii) මෙම චක්‍රලේඛය සම්බන්ධව යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වේ නම් පහත සඳහන් දුරකථන අංක මගින් ලබාගත හැකිය.

| | | |
|---|---|---|
| 1. එච්. හේමාල් කස්තුරිආරච්චි මහතා | -අධ්‍යක්ෂ | -2484850 |
| 2. එන්.කේ.ජී.කේ. නැම්මවත්ත මහතා | -අධ්‍යක්ෂ | -2484784 |
| 3. පී.බී.එස්.සී. නෝනිස් මහතා | -සහකාර අධ්‍යක්ෂ | -2484939 |
| 4. කේ. මීගහගේ මහතා | -සහකාර අධ්‍යක්ෂ | -2484940 |

පී. බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ
ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ආයතන අධ්‍යක්ෂ ජනරාල්
6. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
7. රේගු අධ්‍යක්ෂ ජනරාල්
8. අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
9. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
10. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
11. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්

ඇමුණුම I

| කාණ්ඩය<br>(1) | සුදුසුකම් ලබන තනතුරක සේවා කාලය<br>(2) | වාහන වර්ගය<br>(3) | උපරිම සිලින්ඩර් ධාරිතාව<br>(4) | උපරිම මි.ර.ගැ. වටිනාකම එ. ජ . ඩො.<br>(5) | ආනයනකරු විසින් ගෙවිය යුතු තීරුබදු හා එකතු කළ අගය මත බදුවල එකතුව, මි.ර.ගැ. වටිනාකමෙන් ප්‍රතිශතයක් වශයෙන්<br>(6) |
|---|---|---|---|---|---|
| කාණ්ඩ I | මෙම චක්‍රලේඛයෙහි 01 ඡේදයෙහි සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් | පෙට්‍රල් | 1400 CC | 11,500 | 25 |
| | | | 1600 CC | 12,500 | 35 |
| | | ඩීසල් | 2000 CC | 14,000 | 40 |
| කාණ්ඩ II | මෙම චක්‍රලේඛයෙහි 01 ඡේදයෙහි අවම සුදුසුකම් සපුරාලීමෙන් පසු අවම වශයෙන් අවු.5 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් | පෙට්‍රල් | 1400 CC | 11,500 | 25 |
| | | | 1600 CC | 12,500 | 35 |
| | | | 1800 CC | 14,000 | 40 |
| | | ඩීසල් | 2000 CC | 14,000 | 40 |
| | | | 2800 CC | 16,000 | 45 |

ඇමුණුම II

**<u>වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 02 යටතේ වාහනයක්</u>**
**<u>ආනයනය කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය</u>**

1. (i) මුලකුරු සමඟ නම:
 (ii) සම්පූර්ණ නම:
 (iii) ජාතික හැඳුනුම්පත් අංකය:
 (iv) සේවය කරන (අ) දෙපාර්තමේන්තුව / ආයතනයේ නම:
 (ආ) අමාත්‍යාංශය:

 (v) රාජකාරි ලිපිනය:

 (vi) පුද්ගලික ලිපිනය:

 (vii) දුරකථන අංකය: රාජකාරි: පුද්ගලික:

2. (i) සේවය සහ පන්තිය/ ශ්‍රේණිය:
 (ii) සේවයේ ස්ථිර කළ දිනය:
 (iii) වර්තමාන තනතුරු නාමය:
 (iv) නිලධාරියා අනුග්‍රහයන් සඳහා සුදුසුකම් ලබන තනතුර/පන්තිය/ශ්‍රේණියට පත්වූ දිනය:
 (v) අධි සේවක පදනම මත හෝ නිලධාරියාට පෞද්ගලික වනයේ පත්කර තිබේද යන වග:
 එසේ නම් තනතුරට පත්කල දිනය (අදාළ නම් පමණි):
 (vi) චක්‍රලේඛයේ සඳහන් පරිදි අදාල උපලේඛනය (අදාළ නම් පමණි):
 (vii) චක්‍රලේඛයේ 01 ඡේදයේ උප වගන්තිවල සඳහන් පරිදි සුදුසුකම් ලබන තනතුරේ සක්‍රිය සේවා කාලය:

| තනතුර | සිට | දක්වා | මුලු සේවා කාලය | | |
|---|---|---|---|---|---|
| | වර්ෂය මාසය දිනය | වර්ෂය මාසය දිනය | වර්ෂ | මාස | දින |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| එකතුව | | | | | |

3. (i) පසුගිය වසර 05 තුළ කිසියම් අනුග්‍රහක යෝජනා ක්‍රමයක් යටතේ වාහනයක් ආනයනය කර ඇත්ද ?
 (ii) එසේ වාහන ආනයනය කළ දිනය:

4. ආනයනය කිරීමට අපේක්ෂිත වාහනයේ

(i) පන්තිය/වර්ගය හා මෝස්තරය:

(ii) ඩීසල් හෝ පෙට්‍රල් ද යන්න:

(iii) සිලින්ඩර ධාරිතාවය:

(iv) ණයවර ලිපි විවෘත කිරීමට අපේක්ෂිත බැංකුව හා ශාඛාවෙහි නම:

(v) චක්‍රලේඛයේ ඇමුණුම (1) අනුව අදාළ වන කාණ්ඩය:

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය මත සත්‍යවුත්, නිවැරදි වුත්, ඒවා බව මෙහිදී ප්‍රකාශ කර සිටිමි. මා විසින් ප්‍රකාශ කරන ලද ඉහත සඳහන් තොරතුරු වලට අදාළව යම් වෙනසක් වේ නම් නොපමාව ඒ පිළිබඳව භාණ්ඩාගාරයේ ලේකම් ගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි. මෙහි සපයන ලද තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මෙම යෝජනා ක්‍රමය යටතේ වාහනයක් ආනයනය කිරීම සඳහා අත් හරින ලද තීරුබදු, අනෙකුත් බදු හා ගාස්තු මාගෙන් ආපසු අයකරගත හැකි බවද මෙම චක්‍රලේඛයේ සඳහන් වන අදාල කොන්දේසි හෝ නියමයන් උල්ලංඝණය වුවහොත්, චක්‍රලේඛය ප්‍රකාරව රේගු ආඥා පනත යටතේ නීතිමය ක්‍රියා මාර්ගවලට මා යටත්වන බවද, ප්‍රකාශ කරමි.

දිනය: අයදුම්කරුගේ අත්සන

මගේ අංකය

ලේකම්

අමාත්‍යාංශය

ඉහත අයදුම් පත්‍රයේ 1, 2 හා 3 හි සඳහන් විස්තර පරීක්ෂා කල බවත්, ඒවා නිවැරදි බවත්, .

මහතා/මහත්මිය/මෙනෙවිය මෙම අනුග්‍රහය සඳහා සුදුසුකම් ලබන බවත්, සහතික කරමි. වෙළඳ, තීරුබදු සහ ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 02 හි අනුග්‍රාහක යෝජනා ක්‍රමය යටතේ වාහනයක් ආනයනය කිරීම සඳහා . මහතා / මහත්මිය / මෙනෙවිය වෙත අනුමැතිය ලබාදීම නිර්දේශ කරමි.

දිනය: දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා

අත්සන සහ නිලමුද්‍රාව

අයදුම්පතේ අනුක්‍රමික අංකය:

මගේ අංකය:

අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

අයදුම්කරු සම්බන්ධයෙන් සපයන ලද දත්ත හා තොරතුරු වල නිරවද්‍යභාවය පිළිබඳ සෑහීමකට පත්වීමෙන් පසු අයදුම්කරු වන .......................... මහතා/ මහත්මිය/මෙනෙවිය වෙත වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 02 යටතේ වාහනයක් ආනයනය කිරීමට අනුමැතිය ලබාදිම නිර්දේශ කරමි.

දිනය:

ලේකම්/ අමාත්‍යාංශය
අත්සන සහ නිලමුද්‍රාව

උපලේඛනය I

| | | |
|---|---|---|
| පාර්ලිමේන්තුව | : | පාර්ලිමේන්තු මහ ලේකම් |
| | : | නියෝජ්‍ය පාර්ලිමේන්තු මහ ලේකම් |
| | : | සහකාර පාර්ලිමේන්තු මහ ලේකම් |
| | : | වේත්‍රධාරී |

| | | |
|---|---|---|
| | : | හැන්සාඩ් සංස්කාරක |
| | : | සම්බන්ධීකරණ ඉංජිනේරු |
| | : | අධ්‍යක්ෂ |
| | : | නියෝජ්‍ය වේත්‍රධාරී |
| | : | ප්‍රධාන පාර්ලිමේන්තු කථා පරිවර්තක |
| | : | පුස්තකාලයාධිපති |
| | : | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) |
| | : | ගණකාධිකාරී |
| | : | නියෝජ්‍ය හැන්සාඩ් සංස්කාරක |

## උපලේඛනය II

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා යුධ හමුදාව | : | ලුතිනන් කර්නල් සහ ඉහළ |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | : | වින්කමාණ්ඩර් සහ ඉහළ |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | : | කොමාන්ඩර් සහ ඉහළ |

උපලේඛනය III

| | | |
|---|---|---|
| විශ්ව විද්‍යාල | : | කුලපති |
| | : | උප කුලපති |
| | : | මහාචාර්ය |
| | : | සහාය  මහාචාර්ය |
| | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| | : | කථිකාචාර්ය |
| | : | පුස්තකාලයාධිපති |
| | : | නියෝජ්‍ය පුස්තකාලයාධිපති |
| | : | අධ්‍යක්ෂ |
| | : | ඉංජිනේරු (පළමු හා දෙවන ශ්‍රේණිය) |
| | : | වෛද්‍ය නිලධාරි |
| | : | දන්ත වෛද්‍ය නිලධාරි |
| | : | ලේඛකාධිකාරි/ නියෝජ්‍ය ලේඛකාධිකාරි/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි |
| | : | මුල්‍යාධිකාරි/නියෝජ්‍ය මුල්‍යාධිකාරි/ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි |

| | | |
|---|---|---|
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | : | ලේකම් |
| | : | අතිරේක ලේකම් |
| | : | මුල්‍ය පාලක |
| | : | ගණකාධිකාරි |
| | : | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| | : | නියෝජ්‍ය ලේකම් |
| | : | නියෝජ්‍ය ගණකාධිකාරි |
| | : | නියෝජ්‍ය අභ්‍යන්තර විගණක |
| | : | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| | : | ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරි |